**පන්විල ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පන්විල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට පන්විල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මුල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳව වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් යටතේ හුළුගහ නැරඹුම් මැදිරියේ ගොඩනැගිල්ල රු.12,165,075 ක් තුළ රු.235,602 ක කොන්ත්‍රාත්කරු වෙත නොගෙවූ වටිනාකම ඇතුළත් වීමෙන් ගොඩනැගිලි ශේෂය රු. 235,602 කින් වැඩියෙන් දැක්වුණි. | කඩිනමින් නිවැරදි කරන බව. | නිවැරදිව උපලේඛන පිළියෙල කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශේෂ පත්‍රයේ ස්ථාවර වත්කම් වලට අදාළ උපලේඛනවල සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පැවති එකතුව රු.64,087,086 ක ඉඩම් හා ගොඩනැගිලි 19 ක වටිනාකම් වෙන් වෙන්ව හඳුනාගැනීමට නොහැකි විය. | ඉදිරියේදී විධිමත් තක්සේරුවක් සිදුකරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19 (xi) වගන්තිය | සභාව සතු පර්චස් 09.69 ක් වූ හිස් බිම් කට්ටි 07 ක් අමාත්‍යවරයාගේ අනුමැතියකින්, තක්සේරු කිරීමකින් හා ගිවිසුම්ගතවීමකින් තොරව බාහිර පාර්ශව වෙත භාවිතයට ඉඩහැර තිබුණි. | බදු කාලය වසර 03 ක් ඉක්මවා නොමැති බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථාව) පනත | | | |
| | (i) ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | සභා බල ප්‍රදේශයේ පිහිටි ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන 26 කින් 2019 සිට 2023 දක්වා ත්‍රීරෝද රථ 198 කින් ගාස්තු රු. 675,975 අයකර ගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | (ii) ප්‍රචාරක දැන්වීම් පිළිබඳ අතුරු ව්‍යවස්ථාව | ප්‍රචාරක දැන්වීම් පුවරු 158 කින් සමාලෝචිත වර්ෂය තුළදී ගාස්තු 243,668 ක් අයකරගෙන නොතිබුණි. | හිඟ අයකර ගැනීමට කටයුතු කරන බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සමාලෝචිත වර්ෂයට අදාළව ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදී සමීක්ෂණය සිදුකරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (3) | කාලය ඉක්මවූ කඩ කාමර බදු කරුවන් 04 දෙනෙකුගේ රු. 490,000 ක තැන්පත් නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,339,713 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.301,966 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 1,472,500 | 1,865,341 | 2,105,403 | 888,886 | 2,663,363 | 1,790,807 | 1,838,121 | 1,128,948 |
| (ii) | කුලී | 3,964,920 | 3,076,450 | 1,739,250 | 6,161,900 | 2,631,600 | 2,373,290 | 1,154,160 | 4,824,700 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,719,239 | 1,604,195 | 1,488,004 | 602,809 | 1,926,000 | 1,362,790 | 1,520,667 | 486,618 |
| (iv) | වෙනත් ආදායම් | 5,072,200 | 6,078,539 | 6,588,050 | 6,610,639 | 5,811,800 | 6,596,636 | 5,703,291 | 7,120,150 |
| | | 12,228,859 | 12,624,525 | 11,920,707 | 14,264,234 | 13,032,763 | 12,123,523 | 10,216,239 | 13,560,416 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

**සභාවේ ආදායම් රැස්කිරීමේ කායර්සාධන සම්බන්ධ නිරීක්ෂණ දැක්වේ.**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **වරිපනම් හා බදු** | | |
| (i) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.888,886 ක් වූ අතර, එක ඒකකයක වරිපනම් හිඟය රු.5,000 ඉක්මවූ වරිපනම් ඒකක 24 කින් එකතුව රු.190,798 ක් විය. | ඉදිරි වර්ෂය තුළ හිඟ අයකර ගැනීමට කටයුතු සූදානම් කර ඇති බව. | පනතේ විධිවිධාන ප්‍රකාරව ආදායම් අයකළ යුතුය. |
| (ii) | 1946 අංක 30 දරන වරිපනම් හා තක්සේරු ආඥා පනතේ 20 වගන්තිය ප්‍රකාරව වරිපනම් දේපල වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවද, 2016 වර්ෂයේ තක්සේරු වාර්තාව අනුව 2023 වර්ෂය සඳහා වරිපනම් බදු අයකර තිබුණි. | ඉදිරි වසර තුළ තක්සේරු කිරීමට කටයුතු කරන බව. | තක්සේරු කර ආදායම් අයකර ගත යුතුය. |
| (ආ) | **කඩ කුලී** | | |
| | සභාවට අයත් පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 30 ක කඩ කුලී 2016 වර්ෂයේ තක්සේරු කර 2019 වර්ෂයේ මෙම | නීත්‍යානුකූලව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ කඩ කුලී අයකළ යුතුය. |

| | | |
|---|---|---|
| තක්සේරුව ක්‍රියාත්මක කිරීමට කටයුතු කර තිබුණද කඩ හිමියන් විසින් තක්සේරුව ප්‍රතික්ෂේප කර කුලී ගෙවීම පැහැර හැර තිබුණි. මේ හේතුවෙන් 2019 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දින දක්වා එකතුව රු.5,872,250 ක කඩ කුලී අයකර නොතිබුණි. | | |

**(ඇ) වෙනත් ආදායම්**

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.958,674 ක් වූ අතර, එක ඒකකයක ජල ගාස්තු හිඟය රු.5,000 ඉක්මවූ ජල පාරිභෝගික ඒකක 82 කින් එකතුව රු.656,030 ක් විය. | ඉදිරියේදී හිඟ අය කිරීමට කටයුතු කරන බව. | හිඟ ජල ගාස්තු අය කළ යුතුය. |

**(ඈ) උසාවි දඩ හා මුද්දර ගාස්තු**

| | | |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.387,247 ක් හා මුද්දර ගාස්තු රු.3,988,000 ක් විය. | පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. | හිඟ මුද්දර ගාස්තු හා උසාවි දඩ ගෙන්වා ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පනතින් පවරා ඇති කාර්යයන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ සභාවට අයත් ජල ව්‍යාපෘති 03 ක 2023 වර්ෂයේ සිදුකර තිබුණු ජල සාම්පල් පරීක්ෂණ වාර්තාවන්ට අනුව ඊ කෝලි (E Coli) බැක්ටීරියා සාන්ද්‍රනය හා කොලිෆෝම් (Coliform) බැක්ටීරියා සාන්ද්‍රනය අයහපත් තත්ත්වයේ පැවතුණි. ඒ සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78 (1) වගන්තිය අනුව මහජන සෞඛ්‍ය බලධාරියා ලෙස සභාව කටයුතු කළයුතු බව දැක්වුවද ඒ පිළිබඳ කිසිදු | පිරිසිදු ජලය ලබාදීමට කටයුතු කරන බව. | පිරිසිදු ජලය බෙදා හැරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සැලකිල්ලක් නොදක්වා බීමට නුසුදුසු අපවිත්‍ර ජලය මහජනතාවට බෙදා හැර තිබුණි. | | |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 93 (ආ) වගන්තියේ විධිවිධාන වලට අනුව ප්‍රදේශයේ නිවාසවල මල අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විධිමත් ලෙස වලවල් නිසි කාල සීමාව තුළ පවිත්‍ර කිරීම හා හිස් කිරීමට හැකිවන පරිදි ගලී රථ සේවාවක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | මිලදී ගැනීමට මූල්‍ය ශක්තියක් නොමැති බව. | පවතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3.2 හඳුනාගත් පාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසාන දිනට මූල්‍ය ප්‍රකාශනවලට ඉදිරිපත් කර තිබුණු යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ උපලේඛනය තුළ පරිගණක 22 ක් දක්වා තිබුණ ද භෞතිකව පරිගණක 18 ක් පැවතියෙන් රු.172,560 ක පරිගණක 4 ක ඌනතාවයක් පැවතිණි. | ඉදිරියේදී නිවැරදි කරන බව. | ඌනතාවයන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට සිදුකළ භාණ්ඩ සමීක්ෂණයේදී භාණ්ඩ ඒකක 08 කට අදාළ උපකරණ 51 ක ඌනතාවයක් පැවතුණි. | අලාභය අයකරගැනීමට කටයුතු කරන බව. | අලාභය ගණනය කර අයකරගත යුතුය. |

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතුව රු.357,075 ක් වූ අතර ඉන් වසර 3 ත් 5 ත් අතර කාලයට අදාළ ගිණුම් ශේෂ එකතුව රු.36,200 ක් හා වසර 5 ට වැඩි කාලයක් පවතින එකතුව රු.17,223 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | අදාළ කාලය තුළ මුදල් අයකර ගත යුතුය. |

### 3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2015 වර්ෂයේදී රු.2,000,000 ක් වැයකර ඉදිකර තිබුණු නකල්ස් නිවාඩු නිකේතනය සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් නිෂ්කාර්යව හා ඌන උපයෝජිතව පැවතුණි. මෙම ගොඩනැගිල්ල සංචාරක ආකර්ශනය ලබාගෙන ආදායම් ඉපයීම අරමුණු කරගෙන ඉදිකර තිබුණද අරමුණුගත කාර්ය ඉටුනොකර විනාශ වීමට ඉඩහැර තිබුණි. | ප්‍රතිපාදන නොලැබීම මත ඌන උපයෝජිතව පැවති බව. | ඵලදායි කාර්යයකට යොදාගත යුතුය. |

### 3.5 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 – 2022 වර්ෂවල රු.9,586,975 ක් වැයකර නකල්ස් සංචාරක මධ්‍යස්ථානය ඉදිකර තිබුණු රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් ඉඩමේ අයිතිය සභාව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පවරා ගැනීමට කටයුතු කරන බව. | අයිතිය පවරා ගත යුතුය. |

### 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මත 2021 වර්ෂයේ රු.14,000,000 ක් ඇස්තමේන්තු කර රු.13,087,407 කට ගිවිසුම්ගතව නකල්ස් සංචාරකයින් සඳහා පහසුකම් සපයන මධ්‍යස්ථානයේ ආගන්තුක සත්කාර නිවහනක් ඉදිකිරීමට කටයුතු කර තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු විසින් රු.5,866,560 ක වැඩ කොටසක් ඉටුකර 2022 මැයි 30 දින බිල්පත් ඉදිරිපත් කර තිබුණි. එම කාලය තුල බිල්පත් සඳහා ගෙවීම් නොකිරීම හේතුවෙන් රු.7,220,847 ක වැඩ කොටසක් ඉටු නොකර ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි. පසුව අමාත්‍යාංශය විසින් කොන්ත්‍රාත්තරු සඳහා 2023 මැයි 29 දින | නව ඇස්තමේන්තුවක් යටතේ ඉදිකරන බව. | ගොඩනැගිල්ල ඉදිකර ප්‍රයෝජනවත් කාර්යයකට යොදවා ගත යුතුය. |

රු.4,664,004 ක් ගෙවීම් කර අතහැර දමා තිබූ වැඩ කොටස් වෙනුවෙන් ව්‍යාපෘතිය නැවත ආරම්භ කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ රු.18,365,000 ක ඇස්තමේන්තුව පිළියෙල කර තිබුණි. නියමිත කාලය තුළ වැඩ කොටස් අවසන් කිරීමට ඉඩ ලබා නොදීම හේතුවෙන් රු.11,144,153 ක අලාභයක් සිදුව තිබුණි.

## 3.7 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | අනුමත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී ඉන් තනතුරු 07 ක පුරප්පාඩු 10 ක් ද එක් තනතුරක අතිරික්තතා 05 ක් ද පැවතුණි. | පුරප්පාඩු සඳහා ආදාල පාර්ශවයන් දැනුවත් කර ඇති අතර අතිරික්ත කාර්ය මණ්ඩලය රාජකාරී සඳහා යොදවාගන්නා බව. | අනුමත කාර්යමණ්ඩලය අනුව අදාළ කටයුතු කළ යුතුය. |
| **(ආ)** | සමාලෝචිත වර්ෂයේ සේවය අත්හිටවූ නිලධාරියෙකුගෙන් හා 2020 වර්ෂයේ මිය ගොස් ඇති සේවකයින් දෙදෙනෙකුගෙන් එකතුව රු.555,919 ක ණය ශේෂයක් විය. | ණය පියවා ගැනීමට කටයුතු කරන බව. | ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනතේ නියමයන්ට අනුව සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන තිබුණද ඒවා ලභාකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අදාළ කටයුතු ඉටුකරන බව. | තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක හඳුනාගෙන ඒවා ලභා කර ගැනීමට හා දර්ශක හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |